තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය Information Communication Technology තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය Information Communication Technology Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය Information Communication Technology Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara සුදේශ් ප්‍රියංකර Sudesh Priyankara

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

## 10 ශ්‍රේණිය - පළමු පාඩම - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**ICT** | **නම** :-.................................................................................... | **අධ්‍යාපන ආයතනය** :- …………………..

Sudesh Priyankara

1. පරිගණකයේ පරිණාමයට අදාළ භාවිතා කළ ඉලෙක්ටොනික තාක්ෂණයට නිවැරදිව දක්වා ඇත්තේ කුමක ද.?
   - a) ට්‍රාන්සිස්ටර් / අනුකලිත පරිපථ / රික්තක නල
   - b) ට්‍රාන්සිස්ටර් / රික්තක නල / අනුකලිත පරිපථ
   - c) රික්තක නල / අනුකලිත පරිපථ / ට්‍රාන්සිස්ටර්
   - d) රික්තක නල / ට්‍රාන්සිස්ටර් / අනුකලිත පරිපථ

2. පුස්තකාල තොරතුරු පද්ධතියකට පරිශීලකයකු විසින් පොතේ නම ඇතුළත් කළ විට අදාළ දත්ත සමුදාය පිරික්සීමෙන් එම පොත පුස්තකාලයේ තිබේ ද යන්න දක්වයි. මෙම පද්ධතියේ ආදාන, ක්‍රියාවලිය හා ප්‍රතිදානය නිවැරදිව දක්වා ඇත්තේ.?
   - a) පොතෙහි නම / පොත තිබේ ද යන වග / දත්ත සමුදාය පරීක්ෂා කිරීම.
   - b) පොතෙහි නම / දත්ත සමුදාය පරීක්ෂා කිරීම / පොත තිබේ ද යන වග
   - c) දත්ත සමුදාය පරීක්ෂා කිරීම / පොතෙහි නම / පොත තිබේ ද යන වග
   - d) දත්ත සමුදාය පරීක්ෂා කිරීම / පොත තිබේ ද යන වග / පොතෙහි නම

3. දත්ත තොරතුරු බවට පත් කරන පහත පරිවර්තනය සලකන්න.

   දත්ත → X → තොරතුරු
   - a) සන්දර්ශනය කිරීම ( Displaying )
   - b) සැකසුම ( Processing )
   - c) ක්‍රම ලේඛනය ( Programming )
   - d) පරීක්ෂා කිරීම ( Testing )

4. තාක්ෂණයේ දියුණුවත් සමගම රික්තක නළ සඳහා ට්‍රාන්සිස්ටර් ආදේශ විය. එයට අදාළව පරිගණකයේ ඇති වූ වෙනස්කම් නිවැරදිව දැක්වෙන්නේ පහත සඳහන් කුමන පිළිතුරෙන් ද.?
   - a) වේගය අඩු විය / විදුලි භාවිතය වැඩි විය / විශාලත්වය අඩු විය
   - b) වේගය අඩු විය / විදුලි භාවිතය වැඩි විය / විශාලත්වය වැඩි විය
   - c) වේගය වැඩි විය / විදුලි භාවිතය අඩු විය / විශාලත්වය අඩු විය
   - d) වේගය වැඩි විය / විදුලි භාවිතය අඩු විය / විශාලත්වය වැඩි විය

5. පහත දෑ සලකන්න. ඉන් නිවැරදි ප්‍රකාශය වන්නේ ?

   A – ශිෂ්‍යයකු ගණිත විෂයට ලබා ගත් ලකුණු

   B – පන්තියේ සියලු ශිෂ්‍යයන්ගේ ගණිත විෂයයෙහි සාමාන්‍ය ලකුණු
   - a) A හා B දෙකම දත්ත නිරූපනය කරයි
   - b) A හා B දෙකම තොරතුරු නිරූපනය කරයි
   - c) A දත්ත නිරූපණය කරන අතර B තොරතුරු නිරූපනය කරයි
   - d) A තොරතුරු නිරූපණය කරන අතර B දත්ත නිරූපනය කරයි

6. පරිගණක පරිණාමය පිළිබඳ ව සකකා බැලීමේ දී රික්තක නළය ට්‍රාන්සිස්ටරය මගින් ප්‍රතිස්ථාපනය වූ අතර ඉන් අනතුරුව ට්‍රාන්සිස්ටරය අනුකලික පරිපථ මගින් ප්‍රතිස්ථාපනය විය. මෙහි දී පරිගණකයේ ….A… වැඩි වූ අතර ….B…. අඩු විය.

   A, B සඳහා සුදුසු වන්නේ..

a) කාර්යක්ෂමතාවය / භෞතික ප්‍රමාණය
b) කාර්යක්ෂමතාවය / විශ්වසනීයතාව
c) භෞතික ප්‍රමාණය / කාර්යක්ෂමතාව
d) භෞතික ප්‍රමාණය / පිරිවැය

7. පසුගිය පස් වසර තුළ වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව පෙන්වීමට ප්‍රස්තාරයක් නිර්මානය කිරීම සඳහා පරිගණක ක්‍රමලේඛයක් ලියයි. ක්‍රමලේඛයට අදාල ආදාන / ක්‍රියාවලිය හා ප්‍රතිදාන පහත A සිට D දක්වා වන අනුපිළිවෙළකට නොව පියවර මඟින් දී ඇත.

A – පසුගිය පස් වසර තුල වාර්ථා වූ මුලු ඩෙංගු රෝගීන් සංඛ්‍යාව දැක්වෙන ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න
B – එක් එක් වසර තුල වාර්ථා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව
C – මෙම වර්ෂය
D – පසුගිය පස් වසර සඳහා වාර්තා වූ මුලු ඩෙංගු රෝගීන් සංඛ්‍යාව ගණනය කරන්න

| | | |
|---|---|---|
| a) ආදාන : A හා B | ක්‍රියාවලිය : C | ප්‍රතිදාන : D |
| b) ආදාන : B හා C | ක්‍රියාවලිය : D | ප්‍රතිදාන : A |
| c) ආදාන : B | ක්‍රියාවලිය : C හා D | ප්‍රතිදාන : A |
| d) ආදාන : B හා D | ක්‍රියාවලිය : A | ප්‍රතිදාන : C |

8. පුද්ගලයකු තම ATM කාඩ්පත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයට ඇතුල් කොට රහස් අංකය ලබා දෙයි. ඉන් පසු ලබා ගතයුතු මුදල ලබා දීම සිදු කරයි. ගිණුමේ පවතින ශේෂය පිරික්සීමෙන් අනතුරුව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය මඟින් මුදල් ලබා දීම , යාවත්කාලීන කිරීම හා නව ශේෂය දැක්වීම සිදු කරයි.
ඉහත සිද්ධියට අදාල ආදානයක් / ක්‍රියාවලියක් හා ප්‍රතිදානයක් පිළිවෙළින් දක්වා ඇත්තේ පහත කවරක ද.?
a) ලබාගත යුතු මුදල / නව ශේෂය / මුදල්
b) ලබාගත යුතු මුදල / ශේෂය යාවත්කාලීන කිරීම / නව ශේෂය
c) නව ශේෂය / පුද්ගල හැඳුනුම් අංකය / ලබා ගත් මුදල
d) ශේෂය යාවත්කාලීන කිරීම / පුද්ගල හැඳුනුම් අංකය / නව ශේෂය

9. පරිගණක තාක්ෂණයේ පළමු පරම්පරාවේ සිට නූතන පරම්පරාව දක්වා පරිණාමයේ දී පහත සඳහන් කුමක් සිදුවී ද.?
A – පරිගණකයේ සැකසුම් හැකියාව වැඩි විය
B – මධ්‍ය සැකසුම් ඒකකය තුළ වර්ග සෙන්ටිමීටරයක් තුල ඇති ට්‍රාන්සිස්ටර් සංඛ්‍යාව වැඩි විය
C – පරිගණක ආචයය ධාරිතාවය වැඩි විය
a) A හා B පමණි b) A හා C පමණි c) B හා C පමණි d) A,B හා C සියල්ලම

10. e – රාජ්‍ය සේවාවක් සඳහා උදාහරනයක් නොවන්නේ
a) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ අපොස සා/පෙළ ප්‍රතිඵල ලබා ගැනීම
b) මාර්ගගත සාප්පුවකින් අයිතම මිල දී ගැනීම
c) පුද්ගල ලියාපදිංචි කිරීමේ දෙපාර්ථමේන්තුවෙන් ජාතික හැඳුනුම්පත් අයදුම්පත්‍රය බාගැනීම
d) ජාතික ජල සම්පාදන හා ජල පවහන මණ්ඩලයේ වෙබ් අඩවිය හරහා ජල බිල්පත් මාර්ගගතව ගෙවීම

11. ආදාන හා ප්‍රතිදාන හැකියාවන් දෙකම පවතින්නේ පහත සඳහන් කවර උපක්‍රමයක ද.?
a) මෙහෙයුම් යටිය b) ප්‍රකාශ අනු ලක්ෂණ කියවනය c) ස්පර්ශක තිරය d) වෙබ් කැමරාව

12. පරිගණක පරම්පරා සම්බන්ධයෙන් පහත කවරක් නිවැරදි වන්නේ ද .?
a) අනුකලිත පරිපථ හඳුන්වා දෙනු ලැබුවේ පළමු පරම්පරාවේ පරිගණකවල ය
b) රික්තක නළ හඳුන්වා දෙනු ලැබුවේ තුන්වන පරම්පාරාවේ පරිගණකවල ය
c) ට්‍රාන්සිස්ටර් හඳුන්වා දෙනු ලැබුයේ තුන්වන පරම්පරාවේ පරිගණකවල ය
d) අති විශාල පරිමාණයේ අනුකලිත පරිපථ හඳුන්වා දෙනු ලැබූවේ සිව්වන පරම්පරාවේ පරිගණකවලය



Sudesh Priyankara

13. පහත සඳහන් දෑ අතුරින් කුමක් ශ්‍රී ලංකාවේ G2C සේවා හා බැඳී පවතී ද.?

A – අ.පො.ස (සා/පෙළ) විභාග ප්‍රතිඵල මාර්ගගතව බැලීම

B – මාර්ගගතව ආහාර ඇනවුම් කිරීම

C – වාහන ආදායම් බලපත්‍ර මාර්ගගතව අලුත් කිරීම

a) A පමණි b) A හා C පමණි c) B හා C පමණි d) A,B,C යන සියල්ලම

14. දත්ත සැකසීම සඳහා උදාහරණයක් වන්නේ පහත සඳහන් කවරක් ද.?

a) මුදල් ආපසු ගැනීමෙන් පසු බැංකුකරණ මෘදුකාංගයක් භාවිතයෙන් ගිණුමේ ශේෂය ගණනය කිරීම

b) ගොනුවක් USB ධාවකයෙන් පරිගණකයෙන් පරිගණකයේ දෘඪ තැටියට කොපි කිරීම

c) පෞද්ගලික පරිගණකයකට ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගයක් ස්ථාපනය ( install ) කිරීම

d) සුපිරික්සකයක් ( scanner ) භාවිතයෙන් ලිපියක් සුපිරික්සීම

15. ආදාන උපක්‍රම පමණක් අඩංගු වන්නේ පහත සඳහන් කවරක ද?

a) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය / මුද්‍රණ යන්ත්‍රය / යතුරු පුවරුව / මූසිකය

b) මුද්‍රණ යන්ත්‍රය / යතුරු පුවරුව / ස්පර්ශක තිරය / මෙහෙයුම් යටිය

c) පරිගණක තිරය / ආලෝක පෑන / බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය / යතුරු පුවරුව

d) මූසියක / යතුරු පුවරුව / ආලෝක පෑන / මෙහෙයුම් යටිය

16. තොරතුරු පද්ධතියක ප්‍රධාන කාර්යය තුන වන්නේ

a) ආදානය / සැකසීම / ප්‍රතිදානය

b) කේතනය / සම්පාදනය / ක්‍රියාත්මක කිරීම

c) සැලසුම් කිරීම / සංවර්ධනය කිරීම / පරීක්ෂාව

d) තෝරාගැනීම / පිටපත් කිරීම / ඇලවීමයි.

.

17. පරිගණක පරම්පරා සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත කවර වගන්ති ද?

A – පළමු පරම්පරාවේ පරිගණක වල ට්‍රාන්සිස්ටර් හඳුන්වා දී ඇත

B – දෙවැනි සහ තුන්වෙනි පරිගණක පරම්පරාවල උසස් මට්ටමේ ක්‍රමලේඛ භාෂා භාවිත කර ඇත

C – චිත්‍රක පරිශීලක අතුරුමුහුණත් සහිත මෙහෙයුම් පද්ධති හතරවැනි පරම්පරාවේ පරිගණකවල භාවිත කර ඇත

a) A හා B පමණ b) A හා C පමණ c) B හා C පමණ d) A,B හා B සියල්ලම

18. කමල්සිරි රජයේ වෙබ් නාමාවලිය සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට ශ්‍රී ලංකා රජයෙ නිල අන්තර්ජාල බිහිදොරට ( http:/www.gov.lk ) ප්‍රවේශ වේ. කමල්සිරි ශ්‍රී ලංකා රජයේ අන්තර්ජාල බිහිදොරින් ලබා ගත්තේ පහත සඳහන් කුමන සේවාව ද?

a) G2B b) G2C c) G2E d) G2G

19. පහත සඳහන් කුමක් භාවිතකරුවකුගේ දත්ත සැකසුම් කාර්යයකට උදාහරණයක් වේ ද ?

a) පුද්ගල පරිගණකයකට වදන් සැකසුම් මෘදුකාංගයක් ස්ථාපනය කිරීම

b) පුද්ගල පරිගණකයක දෘඪ තැටිය හැඩසවි ( Formatting ) ගැන්වීම

c) වෙබ් අතරික්සුවක් භාවිත කර මාර්ගගත පුවත්පතක් කියවීම

d) ශිෂ්‍යයකු ලබා ගන්නා ලද සාමාන්‍ය ලකුණු පැතුරුම්පතක් භාවිතයෙන් ගණනය කිරීම

20. ශ්‍රී ලංකා රජයේ නිල වෙබ් ද්වාරය (http:/www.gov.lk) වෙත ක්‍රිෂ්ණා පිවිසෙන්නේ මාර්ගගත ක්‍රමයට ඇයගේ වාහන ආදායම් බලපත්‍රය නැවත අලුත් කර ගැනීමට ය. ඇය විසින් ලබා ගන්නා ලද්දේ පහත සඳහන් කුමන සේවාවක් ද?

a) G2B b) G2C c) G2E d) G2G

Sudesh Priyankara